# ප්‍රධාන ලේකම් කාර්යාලය - වයඹ පළාත
பிரதம செயலாளர் அலுவலகம் - வடமேல் மாகாணம்
## Chief Secretary's Office – North Western Province
පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල மாகாண சபை அலுவலகத் தொகுதி, குருநாகல் Provincial Council Office Complex, Kurunegala
ආයතන හා පරිපාලන අංශය தாபனமும் நிறுவாக பிரிவு Establishment and Administration Division


මගේ අංකය / எனது இலக்கம் / My No } NWP/CS/AD/13/8/4/2027 ඔබේ අංකය / உமது இலக்கம் / Your No } දිනය / திகதி / Date } 2026.08. 25

වයඹ පළාත් ආණ්ඩුකාරවර ලේකම්,
වයඹ පළාත් සභා ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,
වයඹ පළාත් සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් ,
වයඹ පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
වයඹ පළාත් සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
වයඹ පළාත් සියළුම ආයතන ප්‍රධානීන් වෙත.

**<u>වයඹ පළාත් සභා සංවර්ධන නිලධාරී සේවයේ වාර්ෂික ස්ථාන මාරු - 2027</u>**

2027 වර්ෂය සඳහා වයඹ පළාත් සභා සංවර්ධන නිලධාරී සේවයේ වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇති බැවින් පහත උපදෙස් පරිදි කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

2.1 ඔබ ආයතනයේ 2026.12.31 දිනට වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සංවර්ධන නිලධාරීන් ලවා (උපාධිධාරී රැකියා යෝජනා ක්‍රම මඟින් රාජ්‍ය සේවයට බඳවා ගනු ලැබ ඇති සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය වී නොමැති සියලුම නිලධාරීන් ද ඇතුලුව) මෙයට අමුණා ඇති ස්ථාන මාරු අයදුම් පත්‍රය (ඇමුණුම 01) සම්පූර්ණ කරවාගෙන **2026.09.30** දිනට පෙර ඔබගේ නිර්දේශය සමඟ අදාළ කඩඉම් මඟින් මා වෙත ඉදිරිපත් කළ යුතුය.

2.2 ස්ථාන මාරු අයදුම් කිරීමේ දී නැවත නැවත සංශෝධන ඉල්ලීම් ඉදිරිපත් නොවන පරිදි ස්ථාන මාරු වීමට කැමති සේවා ස්ථාන 05 ක් නිශ්චිතව සඳහන් කිරීමට නිලධාරීන්ට උපදෙස් දෙන ලෙස දන්වා සිටින අතර, සඳහන් කර ඇති සේවා ස්ථාන පහෙන් එකකට ස්ථාන මාරු ලබා දීමට නොහැකි අවස්ථා වලදී වෙනත් සේවා ස්ථානයක් වෙත ස්ථාන මාරු කිරීමට යටත් වන බවද, නිලධාරීන් දැනුවත් කළ යුතුය.

2.3 මේ සමඟ අමුණා ඇති ඇමුණුම 02 අනුව ඔබ ආයතනයේ වසර 05 කට වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන් පිළිබඳ සාරාංශයක් ද, ඇමුණුම 03 අනුව ස්ථාන මාරු අයැදුම් කර ඇති ඔබ ආයතනයේ වසර වසර 02 කට වැඩි 05 කට අඩු සේවා කාලයක් සහිත නිලධාරීන් පිළිබඳ විස්තරයක් ද ඉදිරිපත් කළ යුතුය.

2.4 වසර 02 ට වැඩි 05 ට අඩු සේවා කාලයක් සහිත නිලධාරීන් ස්ථාන මාරු අපේක්ෂා කරන්නේ නම්, ඒ සඳහා වන විශේෂ හේතු සමඟ ඔබගේ නිර්දේශය ද ඉදිරිපත් කළ යුතු අතර, සේවා කාලය වසර 05 සම්පූර්ණ නිලධාරීගේ ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමෙන් පසුව මේ සම්බන්ධයෙන් කටයුතු කරන බව දන්වා සිටිමි.

2.5 වසර 05 ට වැඩි සේවා කාලයක් ඇති එහෙත් ස්ථාන මාරු අයැදුම් නොකරන නිලධාරීන් ගේ විස්තර ඇමුණුම 04 ආකෘතියට අනුව ඉදිරිපත් කළ යුතුය.




ප්‍රධාන ලේකම් කාර්යාලය / பிரதம செயலாளர் அலுவலகம் / Chief Secretary's Office } Tel : 037-2231769-72 Fax : 037-2222234 e-mai : csnwp@sltnet.lk Web site : www.cs.nw.gov.lk
ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary } Tel : 037-2223777 Fax : 037-2228019 e-mail : csnwp@sltnet.lk
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන) / பிரதி பிரதம செயலாளர் (நிர்வாகம்) / Deputy Chief Secretary (Administration) } Tel : 037-2223195 e-mail : depcsnwp@sltnet.lk

2.6 ඔබ ආයතනයේ වසර 05 හෝ ඊට වඩා වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන් අතුරින් විශේෂිත රාජකාරියක් හෝ විශේෂිත ව්‍යාපෘතියක සේවය සඳහා යොදවා ඇති නිලධාරීන් සිටී නම්, ඔවුන් සම්බන්ධව ස්ථාන මාරු අයැදුම්පත් ඇමුණුම 05 ආකෘතියට අනුව වෙනම ලැයිස්තුවකින් ඉදිරිපත් කළ යුතුය.

2.7 එකම දෙපාර්තමේන්තුවක වසර 05 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර එම දෙපාර්තමේන්තුව යටතේම පවතින ආයතනයකට ස්ථාන මාරු ලබා ඇති නිලධාරීන්ගේ, වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය වසර 02 කට අඩු වුවද, ස්ථාන මාරු සඳහා ඔවුන්ද සලකා බලනු ලබන බැවින් ඔවුන්ගේ විස්තර ඇමුණුම 06 මඟින් ඉදිරිපත් කරන්න.

2.8 ඔබ කාර්යාලයේ සිටින සියලුම සංවර්ධන නිලධාරීන්ගේ තොරතුරු ඇතුලත් සාරාංශයක් ඇමුණුම 07 මඟින් ඉදිරිපත් කරන්න.

2.7 වාර්ෂික ස්ථාන මාරු අයැදුම්පත්‍රය හා ස්ථාන මාරු සම්බන්ධ අනෙකුත් සියළු උපදෙස් වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලයේ නිල වෙබ් අඩවියෙන් ( www.cs.nw.gov.lk ) බාගත කර ගත හැක.

03. එමෙන්ම පහත සඳහන් කරුණු පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කිරිම කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කරවමි.

3.1 වසර 05 ට වැඩි සේවා කාලයක් එකම සේවා ස්ථානයේ සේවය කළ ද ස්ථාන මාරු සඳහා ඉල්ලුම් නොකල නිලධාරීන් හා ස්ථාන මාරු සඳහා ආයතන නම් නොකළ නිලධාරීන් සඳහා සේවා අවශ්‍යතාවයන් අනුව ලබා දෙන ස්ථාන මාරු සම්බන්ධයෙන් කරනු ලබන අභියාචනා සලකා බලනු නොලැබේ.

3.2 ස්ථාන මාරුවීම් ලබාදුන් පසුව විවිධ හේතු ඉදිරිපත් කරමින් ස්ථාන මාරුවීම් අවලංගු කරන ලෙස ලැබෙන ඉල්ලීම් නිර්දේශ නොකරන ලෙසත්, ස්ථාන මාරු සුදුසුකම් ලැබූ නිලධාරීන් නිදහස් කිරීමට හැකිවන පරිදි සුදුසු නිලධාරීන් හට අදාල විෂයයන් පිළිබඳව පුහුණුවක් ලබා දී හෝ වෙනත් විකල්පයක් කල්වේලා ඇතිව යොදා ගැනීම ඔබගේ වගකීම වන බවත් පෙන්වා දෙමි.

04. වහාම ක්‍රියාත්මක වන පරිදි වයඹ පළාත් සභාව තුළ සිදු කරන සංවර්ධන නිලධාරී සේවයේ සුහද ස්ථාන මාරුවීම් හා අනෙකුත් ස්ථාන මාරු සියල්ල නැවත දැනුම් දෙන තෙක් මෙයින් අත්හිටවනු ලබන අතර, අන්තර් පළාත් ස්ථාන මාරු මෙයට බාධාවක් නොවන ලෙස සිදු කරන ලෙසද දන්වමි.

05. එකම සේවා ස්ථානයක දීර්ඝ කාලයක් සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් සම්බන්ධයෙන් සෑම වසරකම විගණන විමසුම්වලට ලක් වන බැවින්, ඔබ ආයතයේ අවුරුදු 05 ට වඩා වැඩි සේවා කාලයක් ඇති සංවර්ධන නිලධාරීන් වාර්ෂික ස්ථානමාරු යටතේ ස්ථාන මාරු කිරීමට ඔබගේ විශේෂ අවධානය යොමු කර ඒ සඳහා ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

06. තවද, කාර්යාලයක අයැදුම් කර ඇති නිලධාරීන් ප්‍රමාණය 1/5 කට වැඩි වන විට කාර්යාලයේ රාජකාරියට බාධාවක් නොවන පරිදි අදාළ තනතුරේ අනුමත සේවක සංඛ්‍යාවෙන් 1/5 ට ආසන්න ප්‍රමාණයක් ස්ථාන මාරු කිරීමට යටත් වේ.

07. වාර්ෂික වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ XVIII පරිච්ඡේදයේ 257 වගන්තිය අනුව කටයුතු කළ යුතු බව අවධාරණය කරන අතර, ඉහත උපදෙස් අනුගමනය කර මෙම වාර්ෂික ස්ථාන මාරුවීම් බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීමට ඔබගෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

අයි.එම්.අයි. ඉලංගකෝන්,
ප්‍රධාන ලේකම්,
වයඹ පළාත. 2026/08/25

C:\Users\user\Desktop\AD08\ස්ථාන මාරු ඉල්ලීම්\& වාර්ෂික ස්ථාන මාරු\2027 වාර්ෂික ස්ථාන මාරු\ස්ථාන මාරු දැන්වීමේ ලිපිය.docx

## වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී සේවයේ වාර්ෂික ස්ථාන මාරු - 2027
## අයදුම් පත්‍රය

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව/කාර්යාලය :-

..............................................................................................................................................

**01.** පෞද්ගලික තොරතුරු

(1.1) නිලධාරියාගේ සම්පූර්ණ නම : -....................................................................................................

..............................................................................................................................................

(1.2) මුලකුරු සමඟ නම : - ..................................................................................................................

(1.3) ජාතික හැඳුනුම්පත් අංකය :- ........................................................................................................

(1.4) උපන් දිනය :- ............................. (1.4.1) 2026.12.31 දිනට වයස අවු:- .......මාස :- .......දින :- .........

(1.5) ස්ත්‍රී /පුරුෂ භාවය :- ...................................................................................................................

(1.6) ස්ථිර පදිංචි ලිපිනය :.....................................................................................................................

..............................................................................................................................................

(1.6)1. ස්ථිර පදිංචියට ආසන්නම නගරය :-.........................................................................

(1.6)2. ස්ථිර පදිංචියේ සිට ආසන්නම නගරයට ඇති දුර (කි.මී.) :-.......................................

(1.7) තාවකාලික ලිපිනය (ඇත්නම්) :- ...................................................................................................

(1.8) හදාරා ඇති උපාධි පාඨමාලාව :- ...................................................................................................

(1.9) වෙනත් සුදුසුකම් (වෘත්තීය / අධ්‍යාපනික) :- ..................................................................................

(1.10) විවාහක / අවිවාහක බව :- ..........................................................................................................

(1.11) කලත්‍රයාගේ නම :- .....................................................................................................................

(1.12) කලත්‍රයාගේ රැකියාව හා වර්තමාන සේවා ස්ථානය :- ......................................................................

(1.13) දරුවන් සිටී නම් දරුවන්ගේ විස්තර :

| අනු අංකය | නම | වයස | ඉගෙනුම ලබන පාසල |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

(1.14) සම්බන්ධ කර ගත හැකි දුරකථන අංක

කාර්යාලය :- ....................................

පෞද්ගලික :- ...................................

**02.** සේවා තොරතුරු

(2.1) මුල් පත්වීම් දිනයː- ..........................................................................................................

(2.2) දැනට සිටින ශ්‍රේණිය / පන්තිය :- ..........................................................................................

(2.3) වර්තමාන සේවා ස්ථානය :- .....................................................................................................

(2.4) වර්තමාන සේවා ස්ථානයේ සේවයට වාර්තා කළ දිනය :- ..........................................................

(2.5) ඔබ වෙත පවරා ඇති රාජකාරි කෙටියෙන් සඳහන් කරන්නː- .........................................................

..........................................................................................................................................

..........................................................................................................................................

(2.6) ඔබ විසින් ලබා ඇති විශේෂ පුහුණු පිළිබඳ විස්තරː- ...................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

(2.7) වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය ( 2026.12.31 දිනට) අවුː- .......... මාස :- ........... දින :-..........

(2.8) පූර්ව සේවා ස්ථාන පිළිබඳ තොරතුරු

| සේවා ස්ථානය | සේවය කළ කාල සීමාව |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

(ඉඩ ප්‍රමාණවත් නොවන්නේ නම් ඇමුණුමකින් ඉදිරිපත් කරන්න)

**03. ස්ථාන මාරු ඉල්ලුම් කරන සේවා ස්ථානය -** ඔබේ මනාපය පරිදි අනුපිළිවලින් සේවා ස්ථාන 5 ක් නම් කළ යුතුය. (ඔබ මනාපය පළ කර ඇති සේවා ස්ථාන 05 අතුරින් එකක් ලබාදීමට නොහැකි අවස්ථාවක පදිංචියට ආසන්න වෙනත් සේවා ස්ථානයක් ලබා දීමට කටයුතු කරනු ලැබේ.)

| අනු අංකය | සේවා ස්ථානය | පදිංචි ස්ථානයේ සිට දුර (කි.මී.) | මෙම සේවා ස්ථානය අයදුම් කිරීමට විශේෂ හේතු ඇති නම් සඳහන් කරන්න |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

**04. ස්ථාන මාරු ඉල්ලීමට හේතුව** (අදාල හේතුව ඉදිරියෙන් X ලකුණ යොදන්න)

1. අවුරුදු 5ක සේවා කාලය ඉක්මවීම. ☐
2. අවුරුදු 2-5 අතර සේවා කාලයක් වුවද ස්ව කැමැත්තෙන් ස්ථාන මාරු ඉල්ලීම. ☐
3. වෙනත් විශේෂ හේතු (හේතුව සඳහන් කළ යුතුය) ..........................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

මා විසින් ඉහත සඳහන් කර ඇති සියළු තොරතුරු සත්‍ය හා නිවරදි බව ප්‍රකාශ කරමි.

................................ ..............................................

දිනය අයදුම්කරුගේ අත්සන

**05. ආයතන ප්‍රධානියාගේ නිරීක්ෂණ/ නිර්දේශය:-**

..........................................................................................................................................

..........................................................................................................................................

ඉහත නිලධාරියාගේ / නිලධාරිනියගේ ස්ථාන මාරු ඉල්ලීම අනුප්‍රාප්තිකයෙකු සහිතව / රහිතව නිර්දේශ කරමි / නොකරමි. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක වන දින සිට නිලධාරියා / නිලධාරිනිය නිදහස් කිරීමට එකඟ වෙමි.

................................ ..............................................

දිනය අත්සන සහ නිල මුද්‍රාව

**06. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය**

ඉහත නිලධාරියාගේ / නිලධාරිනියගේ ස්ථාන මාරු ඉල්ලීම අනුප්‍රාප්තිකයෙකු සහිතව / රහිතව නිර්දේශ කරමි / නොකරමි.

................................ ..............................................

දිනය අත්සන සහ නිල මුද්‍රාව

**07. අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය**

ඉහත ස්ථාන මාරු ඉල්ලීම අනුප්‍රාප්තිකයෙකු සහිතව / රහිතව නිර්දේශ කරමි / නොකරමි.

................................ ..............................................

දිනය අත්සන සහ නිල මුද්‍රාව

ඇමුණුම 02

.........................................

.........................................

.........................................

ප්‍රධාන ලේකම්,

ප්‍රධාන ලේකම් කාර්යාලය,

වයඹ පළාත.

**<u>වයඹ පළාත් සහා රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී සේවයේ වාර්ෂික ස්ථාන මාරු - 2027</u>**

**<u>(ස්ථාන මාරු අයදුම් කරන වසර 05 ට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන්)</u>**

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / ආයතනය :- ..........................................................................................

අනුමත සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව :- ..........................................................................................

දැනට සිටින සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව :- ..........................................................................................

ස්ථාන මාරු අයදුම් කරන නිලධාරීන් සංඛ්‍යාව :- ..........................................................................................

ස්ථාන මාරු නිර්දේශ කරන නිලධාරීන් සංඛ්‍යාව :- ..........................................................................................

පහත නම් සඳහන් නිලධාරින්/නිලධාරිනියන් ගේ ස්ථාන මාරු අයදුම්පත් නිර්දේශ කොට මේ සමඟ එවමි.

| අංකය | නිලධාරියාගේ/නිලධාරිනිය ගේ නම | මුල් පත්වීමේ දිනය | වර්තමාන ශ්‍රේණිය | වර්තමාන ශ්‍රේණියට පත් වූ දිනය | වර්තමාන කාර්යාලයට වාර්තා කළ දිනය | නිර්දේශය අනුප්‍රාප්තිකයෙකු රහිතව/සහිතව |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

දිනය - ..........................

.......................................................

ආයතන ප්‍රධානියා/ දෙපාර්තමේන්තු ප්‍රධානියා

ඇමුණුම 03

..........................................

..........................................

..........................................

ප්‍රධාන ලේකම්,

ප්‍රධාන ලේකම් කාර්යාලය,

වයඹ පළාත.

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී සේවයේ වාර්ෂික ස්ථාන මාරු - 2027**

**(ස්ථාන මාරු අයදුම් කරන වසර 02 කට වැඩි වසර 05 ට අඩු සේවා කාලයක් ඇති නිලධාරීන්)**

පහත නම් සඳහන් නිලධාරීන්/නිලධාරිනියන් ගේ ස්ථාන මාරු අයදුම්පත් නිර්දේශ කොට මේ සමඟ එවමි.

| අංකය | නිලධාරියාගේ/නිලධාරිනිය ගේ නම | මුල් පත්වීමේ දිනය | වර්තමාන ශ්‍රේණිය | වර්තමාන ශ්‍රේණියට පත් වූ දිනය | වර්තමාන කාර්යාලයට වාර්තා කළ දිනය | නිර්දේශය අනුප්‍රාප්තිකයෙකු රහිතව/සහිතව |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

දිනය - ..........................

..........................................................

ආයතන ප්‍රධානියා/ දෙපාර්තමේන්තු ප්‍රධානියා

ඇමුණුම 04

........................................
........................................
........................................

ප්‍රධාන ලේකම්,

ප්‍රධාන ලේකම් කාර්යාලය,

වයඹ පළාත.

**වයඹ පළාත් සහා රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී සේවයේ වාර්ෂික ස්ථාන මාරු - 2027**
**(වසර 05 ක් / ඊට වැඩි සේවා කාලයක් ඇති නමුත් වාර්ෂික ස්ථාන මාරු අයදුම් නොකරන නිලධාරීන්)**

| අංකය | නිලධාරියාගේ/නිල ධාරිනියගේ නම | මුල් පත්වීමේ දිනය | වර්තමාන ශ්‍රේණිය | වර්තමාන ශ්‍රේණියට පත් වූ දිනය | වර්තමාන කාර්යාලයට වාර්තා කළ දිනය | වාර්ෂික ස්ථාන මාරු අයදුම් නොකිරීමට හේතුව | නිර්දේශය අනුප්‍රාප්තිකයෙකු රහිතව/සහිතව |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

දිනය - ..........................

........................................................
ආයතන ප්‍රධානියා/ දෙපාර්තමේන්තු ප්‍රධානියා

ඇමුණුම 05

............................................

............................................

............................................

ප්‍රධාන ලේකම්,

ප්‍රධාන ලේකම් කාර්යාලය,

වයඹ පළාත.

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී සේවයේ වාර්ෂික ස්ථාන මාරු - 2027**
**(විශේෂ රාජකාරී / විශේෂ පුහුණුවක් ලබා විශේෂ ව්‍යාපෘතියක නියුතු නිලධාරීන්)**

පහත නම් සඳහන් නිලධාරීන් / නිලධාරිනියන් ගේ ස්ථාන මාරු අයදුම්පත් නිර්දේශ කොට මේ සමඟ එවමි.

| අංකය | නිලධාරියාගේ/නිලධාරිනිය ගේ නම | ලබා ඇති විශේෂිත පුහුණුව | වර්තමාන ශ්‍රේණිය | වර්තමාන ශ්‍රේණියට පත් වූ දිනය | වර්තමාන කාර්යාලයට වාර්තා කළ දිනය | නිර්දේශය අනුප්‍රාප්තිකයෙකු රහිතව/සහිතව |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

දිනය - ...........................

.........................................................
ආයතන ප්‍රධානියා/ දෙපාර්තමේන්තු ප්‍රධානියා

ඇමුණුම 06

.........................................

.........................................

.........................................

ප්‍රධාන ලේකම්,

ප්‍රධාන ලේකම් කාර්යාලය,

වයඹ පළාත.

**වයඹ පළාත් සභා සංවර්ධන නිලධාරී සේවයේ වාර්ෂික ස්ථාන මාරු - 2027**
**(එක් දෙපාර්තමේන්තුවක වසර 05 කට වැඩි කාලයක් සේවය කර ඇති එම දෙපාර්තමේන්තුව යටතේම ඇති ප්‍රාදේශීය කාර්යාලයකට අභ්‍යන්තර ස්ථාන මාරු ලබා වසර 05 කට අඩු නිලධාරීන්)**

| අංකය | නිලධාරියාගේ / නිලධාරිනියගේ නම | මුල් පත්වීමේ දිනය | වර්තමාන ශ්‍රේණිය | වර්තමාන ශ්‍රේණියට පත් වූ දිනය | අදාළ දෙපාර්තමේන්තුව තුල සේවා කාලය | වර්තමාන කාර්යාලයට වාර්තා කළ දිනය | නිර්දේශය අනුප්‍රාප්තිකයෙකු රහිතව/සහිතව |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

දිනය - ..........................

.......................................................
ආයතන ප්‍රධානියා/ දෙපාර්තමේන්තු ප්‍රධානියා

ඇමුණුම 07

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / ආයතනය :- ........................................................................

අනුමත සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව :- ........................................................................

දැනට සිටින සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව :- ........................................................................

| අනු අංකය | සංවර්ධන නිලධාරියාගේ නම | නිලධාරියා ඔබ ආයතනයේ සේවයට වාර්තා කළ දිනය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |
| 11 | | |
| 12 | | |
| 13 | | |
| 14 | | |
| 15 | | |
| 16 | | |
| 17 | | |
| 18 | | |
| 19 | | |
| 20 | | |
| 21 | | |
| 22 | | |
| 23 | | |
| 24 | | |
| 25 | | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට පෞද්ගලිකවම සෑහීමකට පත්ව සහතික කරමි.

..............................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව